# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2262/30 – 2022 ජනවාරි 12 වැනි බදාදා – 2022.01.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ලංකා වතු සේවා සංගමය (ඒ. එස්. කුමාරගේ මයා වෙනුවෙන්), අංක 19, මද්දේගොඩ පාර, මතුගම.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. හොරණ ප්ලාන්ටේෂන්ස් පීඑල්සි,අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10.
2. වතු අධිකාරි, හල්වතුර වත්ත, ඉංගිරිය

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, මිහිදුපුර, දම්මෝදය මාවත,අංක 13/1127, සරත් චන්ද්‍රසිරි විතාන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2022 ජනවාරි මස 07 වැනි දින,
කොළඹ දී ය.

1A – G 35812 – 10 (2022/01)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

ලංකා වතු සේවා සංගමය (ඒ. එස්. කුමාරගේ මයා වෙනුවෙන්), අංක 19, මද්දේගොඩ පාර, මතුගම.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්,

1. හොරණ ප්ලාන්ටේෂන්ස් පීඑල්සී,අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10.
2. වතු අධිකාරි, හල්වතුර වත්ත, ඉංගිරිය

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ**–

''ඉංගිරිය හල්වතුර වත්තේ සේවය කළ ඒ. එස්. කුමාර මහතා විශ්‍රාම යාමෙන් පසුව නැවත සේවය කර ඇති 2014.06.01 සිට 2017.08.31 දක්වා වන කාලපරිච්ඡේදය සඳහා ද, විශ්‍රාම ගන්වන අවස්ථාව වන විට ගෙවන ලද මාසික වැටුප, මාසික ගෙවල් කුලී දීමනාව සහ වෛද්‍යාධාර මුදල් හිමිවිය යුතු ද? හිමිවිය යුතු නම් ඒ කවර ආකාරයෙන් ද? යන්න පිළිබඳව වේ.''

**බී.කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 01/0129